# ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ තනතුරු පුරප්පාඩු

## 01. වැඩ පරීක්ෂක (කොන්ත්‍රාත් ) තනතුර -

**සුදුසුකම් :-** වයස 45 නොවැඩි, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන (04) ක් සහිතව විෂයයන් ( 06) කින් සමත් වීම. ( සිංහල / දෙමළ, ගණිතය, ඉංග්‍රීසි ද සහිතව.) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර විෂයයන් 03 ක් සමත්වීම.

**ප්‍රවීණතා :-** තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. ශ්‍රී ලංකා පුර වැසියෙක් වීම.

## 02. රියදුරු (කොන්ත්‍රාත්) තනතුර :-

**සුදුසුකම් :-** වයස 45 නොවැඩි, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකින් යටත් පිරිසෙයින් සම්මාන (02) ක් සහිතව විෂයයන් ( 06 ) කින් සමත් වීම. ශ්‍රී ලංකා පුරවැසියෙක් වීම.

**ප්‍රවීණතා :-** මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ බර වාහන පැදවීම සඳහා වූ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම සහ රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු, රිය පැදවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර ( 03 ) ක පළපුරුද්දක් ලබා තිබීම.

සියලුම අයදුම් කරුවන් තමා විසින් සඳ ගන්නා ලද ජීවදත්ත පත්‍රිකාව පහත ලිපිනයට යොමු කරන්න. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ සඳහන් කරන්න. ( විමසීම සහකාර පරිපාලන නිලධාරි)

ජේ. ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය
අංක 191, අනගාරික ධර්මපාල මාවත, කොළඹ 07.
දු.ක. - 0112 695 084 (පාලන)